(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 49.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 අප්‍රේල් 10 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ඉහත ජාතික පාසල් අතරින් නියමිත සුදුසුකම් සපුරා ඇති විදුහල්පතිවරුන් පත් කර ඇති ජාතික පාසල් සහ එසේ නොමැති ජාතික පාසල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙවැනි තත්ත්වයක් තුළ ජාතික පාසල් සංඛ්‍යාව ඉහළ දැමූවද නියමිත සුදුසුකම් සපුරා ඇති විදුහල්පතිවරුන් නොමැතිවීමේ ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

71/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතීවුපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බක්කිඇල්ල පාර, විල්ලුකුලම් පාර සහ අම්බිලාන්තුරෙයි පාර යන මාර්ග ප්‍රධාන ඒකාබද්ධ මාර්ග බවත්;

(ii) පසුගිය කාලයේදී නව මාර්ග රාශියක් ඉදිකරනු ලැබුවද, ඉහත මාර්ග මේ දක්වා ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

93/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට වෙළඳපළේ උග්‍ර සහල් හිඟයක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) පරිභෝජනයට ප්‍රමාණවත් සහල් තොග මේ වනවිට රට තුළ තිබේද;

(iv) ප්‍රධාන වී මෝල් හිමියන් සහල් ඒකාධිකාරයක් පවත්වාගෙන යන බව පිළිගන්නේද;

(v) වී ගොවියාටත්, සහල් පාරිභෝගිකයාටත් සහන සැලසෙන පරිදි සහල් තොග වෙළඳපළට නිකුත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

212/2024

ගරු රෝහණ බංඩාර මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිසියේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලිසියේ උසස්වීම් ලබා දීම ඉතා මන්දගාමීව සිදු වන බව දන්නේද;

(iii) උසස්වීම් ලබා දීම කඩිනම් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) පොලිස් නිලධාරින්ගේ වැටුප් සහ සුබසාධන පහසුකම් ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

518/2025

ගරු ජේ. සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.12.31 දිනට පෙර විශ්‍රාම ලැබූ රජයේ විශ්‍රාමිකයන්ට අග්‍රහාර රක්ෂණ ආවරණය හිමි නොවන නමුත් 2016.01.01 දිනට පසු විශ්‍රාම ලැබූ විශ්‍රාමිකයන්ට අග්‍රහාර රක්ෂණ ආවරණය හිමි වන බව දන්නේද;

(ii) එම අසාධාරණය ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) 1997 වර්ෂයේදී පත් කරන ලද බී.සී. පෙරේරා වැටුප් කොමිසමේ නිර්දේශ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සීමිත පිරිසකට පමණක් ක්‍රියාත්මක වන බව දන්නේද;

(iv) ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් බහුතරයකට අදාළ වන පරිදි එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

541/2025

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) පිළිකා රෝගීන් සඳහා ලබා දෙනු ලබන Anastrazole නැමැති ඖෂධය ඇතුළු අත්‍යවශ්‍ය ඖෂධ බොහොමයක් මහරගම, ජාතික පිළිකා ආයතනයේ නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ආයතනයට දෛනිකව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන රෝගීන් දැඩි දුෂ්කරතාවයට පත් වන අතර ඔවුන්ට ආපසු හැරී යාමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ගැටලුව කඩිනමින් විසඳීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, මල්වතුහිරිපිටිය ප්‍රාදේශීය රෝහල මේ වනතෙක් දිවා රාත්‍රී රෝගී සත්කාරක සේවාවන් පවත්වා ගෙන ගිය නමුත් අනුප්‍රාප්තිකයන් රහිතව වෛද්‍ය කාර්ය මණ්ඩලය ස්ථාන මාරු කිරීම හේතුවෙන් එම සේවාවන් තවදුරටත් පවත්වා ගෙන යාමට දුෂ්කරවී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලෙන් සේවා ලබා ගැනීම සඳහා පැමිණෙන රෝගීන් දැඩි අපහසුතාවයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) මෙම ගැටලුව කඩිනමින් විසඳීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

572/2025

ගරු අතුල වෙළඳගොඩ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර, සූරියවැව සහ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට මායිම්ව පවතින අලි කළමනාකරණ රක්ෂිත භූමිය තුළ අනවසර ඉදිකිරීම් හා වගාවන් ඇති බවත්;

(ii) එය වනඅලින්ගේ ජීවන පැවැත්මට විශාල බාධාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම අනවසර ඉදිකිරීම් හා වගාවන් කවරේද;

(ii) ඉහත සඳහන් අනවසර ඉදිකිරීම් හා වගාවන් සම්බන්ධයෙන් ගනු ලබන කෙටි කාලීන හා දිගු කාලීන පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් අලි කළමනාකරණ රක්ෂිත භූමියෙන් පිටත ඇති ජනාවාස හා වගාබිම්වලට වනඅලි කඩාවැදීම හේතුවෙන් සිදු වන ජීවිත හා වගා හානි උච්චස්ථානයට පැමිණ ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ හේතුවෙන් මේ දක්වා මියගිය පුද්ගලයන් සංඛ්‍යාව සහ වනඅලින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

579/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නිරතව සිටියදී කාන්තාවන්ට එරෙහිව සිදු කර ඇති ලිංගික හා වෙනත් සාපරාධි ක්‍රියා අතරින් වාර්තාවී ඇති ලිංගික හා වෙනත් සාපරාධි ක්‍රියා සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) රජයේ ආයතන තුළදී කාන්තාවන්ට එරෙහිව සිදු කරනු ලබන හිංසන ක්‍රියා මැඩපැවැත්වීම සඳහා කටයුතු කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

581/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ රෝහල් වර්ගීකරණය අනුව එක් එක් වර්ගයේ රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති එම එක් එක් වර්ගයේ රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන සඳහා ලෝක බැංකු ණය මඟින් හෝ වෙනත් ආකාරයකින් හදිසි ප්‍රතිකාර ඒකක (ETU) 18ක් මිලදී ගෙන තිබේද;

(iii) එසේ නම්, එම වර්ෂය කවරේද;

(iv) ඒ වනවිට රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයා කවුරුන්ද;

(v) එම ඒකක මේ දක්වාත් හදිසි ප්‍රතිකාර ඒකක ලෙස පවත්වාගෙන නොයන්නේ නම්, ඒ සඳහා ඇති බාධාව කවරේද;

(vi) එම ඒකක, හදිසි ප්‍රතිකාර ඒකක ලෙස පවත්වාගෙන යාම සඳහා ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

603/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිනුවන්ගොඩ, ජනාධිපති විද්‍යාලයේ පිහිනුම් තටාකයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම පිහිනුම් තටාකය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල සහ මේ වනවිට වියදම් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වියදම් කර නොමැති ඉතිරි මුදල, එම ව්‍යාපෘතියට අදාළ ගිණුමක තැන්පත් කර තිබේද;

(iv) එසේ නම්, එම ගිණුමේ නම සහ ගිණුම් අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පිහිනුම් තටාකය ඉදිකරනු ලබන කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත් සමාගමේ නම කවරේද;

(ii) එම කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත් සමාගම තෝරා ගන්නා ලද පදනම කවරේද;

(iii) මේ වනවිට ඉදිකිරීම්වලින් අවසන් කර ඇති ප්‍රමාණය කොපමණද;

(iv) ඉදිකිරීම් සම්පූර්ණයෙන් අවසන් කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) එම ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතුව කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2025 මැයි 08 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— 2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.

***** *සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***